**14-11-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඉහළම ඉහළ තත්ත්වයක් දිනා ගැනීම සඳහා ස්මරණ වන්දනාවේ කුල්මත්ව නිරතව සිටින්න. මේ ආධ්‍යාත්මික එල්ලුම් ගසයි; ඔබගේ බුද්ධිය නිවහන හා එල්ලා තබා ගත යුතුයි.

**ප්‍රශ්නය:** මෙම දැනුම ධාරණය කර ගැනීමේ හැකියාව නොමැති බුද්ධියක් ඇති අයගේ ලක්ෂණය කුමක්ද?

**පිළිතුර:** ඔවුන් සුළු සුළු කාරණා සම්බන්ධයෙන් කලබලයට පත් වෙති. බුද්ධියෙන් වැඩි වැඩියෙන් දැනුම උකහා ගත් තරමට ඒ පුද්ගලයා අත් විඳිනා සතුට ද ඒ තරමටම වැඩි වනු ඇත. ලෝකය දැන් පරිහානිය කරා ඇද වැටෙනවා, ඉන් සිදු වන්නේ හානියක්ම පමණයි යන දැනුම බුද්ධියට වැටුණු පසු ඔබ කවදාවත් කලබල වන්නේ නැහැ; ඔබ නිරන්තරයෙන් සතුටින්ම සිටීවි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙහි අසුන් ගෙන ඔය සුමිහිරි ආධ්‍යාත්මික දරුවන්ට කරුණු පහදා කියා දෙනවා. පරමාත්ම දෙවියන්ව ඉහළම ඉහළ කෙනෙක් ලෙස හඳුන්වන බව ඔය දරුවන් තේරුම් ගෙන සිටිනවා. ජීවාත්මයන්ගේ බුද්ධියේ යෝගාව නිවහන වෙතට යා යුතුයි. කෙසේ වෙතත් මේ ගැන සිහියෙන් සිටිනා එකම මනුෂ්‍යයෙක්වත් මේ මුළු ලෝකයටම ඇත්තේ නැහැ. සන්‍යාසිවරුන් පවා මෙම බ්‍රහ්ම ලෝකය තම නිවහන යයි කියා සලකන්නේ නැහැ. තමන්ටත් බ්‍රහ්ම ලෝකය හා මුසු විය යුතුයි කියා කියනා නිසා එය නිවහනක් විය නොහැකියි. කෙනෙක් ජීවත් වන්නේ නිවහනකයි. ඔය දරුවන්ගේ බුද්ධිය එහි තිබිය යුතුයි. කෙනෙක්ව එල්ලුම් ගහක එල්ලුවක් සේ ඔබත් දැන් නඟින්නේ ආධ්‍යාත්මික එල්ලුම් ගසකටයි. ඉහළම ඉහළ පියා පැමිණ තමන්ව ඉහළම ඉහළ නිවහන වෙතට ගෙන යනවා කියා ඔබ දැන් ඇතුළාන්තයෙන් දන්නවා. අපි දැන් නිවහන බලා යා යුතුයි. ඉහළම ඉහළ බාබා අපට ඉහළම ඉහළ තත්ත්වයක් ලබා ගැනීමට මඟ පෙන්වනවා. රාවණ රාජ්‍යයේ සෑම කෙනෙක්ම සිටින්නේ පරිහාණියේයි. ඒ අය උසස් අය වන අතර මේ අය පරිහාණියේ සිටින්නනුයි. ඉහළම ඉහළ තත්ත්වයට පත් වෙනවා යන්න ගැන ඔවුන් දන්නේ නැහැ. ඉහළම ඉහළ තත්ත්වයේ සිටි අයවත් පහළම පහළ තත්ත්වයේ සිටිනා අය ගැන කිසිම දෙයක් දන්නේ නැහැ. එකම එක පරමාත්මයට පමණයි ඉහළම ඉහළ කියා කියන්නේ කියා ඔබට දැන් තේරෙනවා. ඔබගේ සිහිය ඉහළට දිව යනවා. ඔහු පරමදාමයේ වැසියායි. අප ජීවාත්මයනුත් එතැන වැසියන් බව කිසිම කෙනෙකුට තේරෙන්නේ නැහැ. අප මෙහි පැමිණෙන්නේ අපගේ චරිත කොටස රඟ දැක්වීමට පමණයි. මෙය කිසිම කෙනෙකුගේ සිතිවිල්ලට හසු වන්නේ නැහැ. ඔවුන් තම තමන්ගේ වැඩ රාජකාරි වල ගැලී සිටිනවා. පරමාත්ම පියා දැන් පැහැදිලි කර කියා දෙනවා: ස්මරණ වන්දනාවේ කුල්මත් වුණු විට ඔබලා ඉහළම ඉහළ අය බවට පත් වේවි. ඔබට ඉහළ තත්ත්වයක් දිනා ගත හැකි වන්නේ ස්මරණය තුළින් පමණයි. ඔබට උගන්වා ඇති දැනුම ඔබ කිසි විටෙක අමතක නොකළ යුතුයි. කුඩා දරුවෙකුට වුවත් ඒ ගැන කිව හැකියි. කෙසේ වෙතත්, යෝගාව පිළිබඳ කරුණු දරුවන්ට තේරෙන්නේ නැහැ. බොහෝ දරුවන්ට ස්මරණ වන්දනාව යන්න ගැන පූර්ණ අවබෝධයක් ඇත්තේම නැහැ. අපි ඉහළටම යනවා. අශාරීරික ලෝකය, සූක්ෂම ලෝකය හා භෞතික ලෝකය තිබෙනවා. පංච මහා භූතයින් සිටින්නේ මෙහියි. සූක්ෂම කලාපයේ හෝ අශාරීරික ලෝකයේ ඒවා නැහැ. මෙම ඥානය දෙන්නේ පරමාත්ම පියාම පමණයි. ඒ නිසා තමයි ඔහුට ඥානයේ මහා සයුර කියා කියන්නේ. ග්‍රන්ථ පොත්පත් රැසක් කියවීම ඥානයයි කියා මිනිස්සු හිතාගෙන සිටිනවා. ඔවුන් විශාල මුදලක් ඉන් උපයා ගන්නවා. ග්‍රන්ථ කියවන අය ඉන් විශාල ගරු සත්කාර ලබනවා. කෙසේ වෙතත් එහි කිසිම ශ්‍රේෂ්ඨත්වයක් නැති බව ඔබට දැන් තේරෙනවා. ඉහළම ඉහළ කෙනා වන්නේ එකම එක පරමාත්මය පමණයි. ඔහු හරහා අපි ඉහළම ඉහළ දෙව්ලොව පාලකවරුන් බවට පත් වෙනවා. දිව්‍ය ලෝකය කුමක්ද? අපාය කුමක්ද? උපත් 84 චක්‍රය කැරකෙන්නේ කෙසේද? ඔබ හැරෙන්න ලෝකයේ සිටිනා වෙන කිසිම කෙනෙක් මේ ගැන දන්නේ නැහැ. මේ සියල්ල නිකම්ම නිකම් හිතළු කියා තමයි ඔවුන් කියන්නේ. එවැන්නන් මේ කුලයට අයිති නැති බව ඔබලා තේරුම් ගත යුතුයි. ඔබ ඉන්අධෛර්යයට පත් විය යුත්තේ නැහැ. මෙය ඔවුන්ගේ චරිතයේ නොමැති දෙයක් බව තේරෙනවා. එම නිසා ඔවුන්ට කිසිවක් තේරුම් ගත නොහැකියි. ඔය දරුවන් දැන් ඔබගේ හිස් හොඳ කෙළින් තබාගෙන සිටිනවා. ඉහළම ඉහළ ලෝකයේ ඔබ සිටිනා විට පහළම පහළ ලෝකය ගැන ඔබලා දන්නේ නැහැ. පහළ ලෝකයේ සිටිනා අය ඉහළ ලෝකයේ සිටිනා අය ගැන දන්නේ

නැහැ. එය හඳුන්වන්නේ දිව්‍ය ලෝකය කියලයි. පිටරට වල අයට දෙව් ලොවට යා නොහැකි වුවත් ඔවුනුත් දිව්‍ය ලෝකය හා පාරාදීසය ගැන කතා කරනවා. ඉස්ලාම් ධර්මයේ අය බහිස්ට් (දිව්‍ය ලෝකය) කියා කියනවා. නමුත් එතැනට යා හැක්කේ කෙසේදැයි කියා ඔවුන් දන්නේ නැහැ. ඔබලාට දැන් විශාල අවබෝධයක් ලැබී තිබෙනවා. ඉහළම ඉහළ පරමාත්ම පියා අපට විශාල දැනුමක් ලබා දෙනවා. මෙම නාටකය හරිම අපූරු ලෙස නිර්මාණය වී තිබෙනවා. නාටකයේ රහස් තේරුම් ගත නොහැකි අය එය හිතළුවක් කියා කියනවා. මෙය අපිරිසිදු ලෝකයක් කියා ඔය දරුවන් දන්නවා. මෙන්න මේ නිසා තමයි මිනිස්සු කන්නලව් කරන්නේ: අහෝ, පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ අපව පාරිශුද්ධ කරවනු මැනව. පරමාත්ම පියා කියනවා: සෑම වසර 5000 කට වතාවක්ම අතීතය පුනරාවර්තනය වෙනවා. පැරණි ලෝකය අලුත් විය යුතුයි. මෙන්න මේ නිසා තමයි මා පැමිණිය යුත්තේ. මම සෑම කල්පයකදීම පැමිණ ඔය දරුවන්ව උතුම්ම උතුම් උත්තමයින් බවට පත් කරවනවා. පාරිශුද්ධ අයට තමයි උත්තමයින් කියන්නේ. අපිරිසිදු අය පහත් අයයි. මෙම ලෝකය අලුත්වටත් පාරිශුද්ධවත් තිබුණා: දැන් එය අපිරිසිඳු වෙලා. ඔබටත් මේ දේවල් එක් එක් මට්ටම් වලින් තේරුම් ගත හැකියි. මේ කරුණු තම සිහියේ තබාගෙන සිටින්නන්ට නිරන්තරයෙන්ම සතුටින් සිටිය හැකියි. මේවා ඔවුන්ගේ සිහියේ නොමැති නම්, යමෙක් යම් දෙයක් කියූ විට නැතිනම් කිසියම් පාඩුවක් විඳීමට සිදු වුණු විට ඔවුන් කලබලයට පත් වෙනවා. බාබා කියනවා: මෙම පරිහානිකාරි ලෝකය දැන් අවසන්ව යා යුතුයි. මෙය පැරණි ලෝකයයි. මිනිස්සු ඉතාමත් පහත් තත්ත්වයන්ට පත් වෙනවා. කෙසේ වෙතත්, කිසිම කෙනෙක් තමන් පහත් කෙනෙක් කියා සලකන්නේ නැහැ. බැතිමතුන් සෑම විටම තම හිස් නමනවා. ඔබ කිසිම පහත් කෙනෙක් ඉදිරියේ තම හිස නමන්නේ නැහැ. ඔබ හිස නමන්නේ උත්තමයින් ඉදිරියේයි. එවන් දෙයක් ඔබ කෙදිනකවත් ස්වර්ණමය යුගයේදී කරන්නේ නැහැ. එසේ කරන්නේ බැතිමතුන් පමණයි. පරමාත්ම පියා ඔබට හිස නමාගෙන ඇවිදින්න කියන්නේ නැහැ. නැහැ. මෙය අධ්‍යයනයක්. ඔබ පරමාත්ම දෙවි පියාණන්ගේ විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නවා. ඉතින් එම නිසා ඔබ තුළ මහත් උද්යෝගයක් තිබිය යුතුයි. විශ්ව විද්‍යාලයේ සිටිනා විට ඉහළ උද්යෝගයකින් සිටියත් පසුව නිවස බලා යන විට එය නැති වී යන ආකාරයේ තත්ත්වයක් නොතිබිය යුතුයි. නිවසේදීත් ඔබ තුළ මෙම කුල්මත් බව තිබිය යුතුයි. ශිව බාබා තමන්ට උගන්වනවා ය කියා මෙහිදී ඔය දරුවන් දන්නවා. මොහු කියනවා: ඥාන සාගරය කියන්නේ මට නොවෙයි. මේ බාබා ඥාන සාගරය නොවෙයි. සාගරයකින් ගංගා මතු වෙනවා. ඇත්තේ එකම එක සාගරයකුයි. බ්‍රහ්මපුත්‍ර නදිය ලොකුම ගංගාවයි. මහ සාගරයට ලොකු ලොකු නෞකා රැසක් ඇතුලු වෙනවා. අන් තැන්වලත් ගංගා රැසක් තිබෙනවා. පාරිශුද්ධ ගංගාවන් කියා දෙයක් ගැන කතා කරන්නේ මෙහි දී පමණයි. පිටරට වල ඇති ගංගා වලට කවුරුත් එහෙම කියන්නේ නැහැ. ගංගාවක් පාරිශුද්ධකරු වෙනවා නම් ගුරු කෙනෙකුගේ අවශ්‍යතාවයක් පැන නගින්නේ නැහැ. ගංගා හා වැව් සොය සොයා මිනිස්සු බොහෝ සේ වෙහෙස වෙනවා. ඇතැම් තැන්වල වැව් ඉතාමත් අපිරිසිඳුයි. ඒ ගැන අහන්නවත් එපා. ඒවායේ ඇති මඩ අරගෙන මිනිස්සු තම ඇඟ පුරා අතුල්ලා ගන්නවා. ඒ සෑම දෙයක්ම පහතට ඇද වැටීමේ මංපෙත් බව ඔබලාගේ සිහියට දැන් ඇතුලු වී තිබෙනවා. ඒ මිනිස්සු මහත් සෙනෙහසකින් ඒවාට යනවා. මෙම ඥානයෙන් ඔබගේ ඇස් විවර වෙලා කියා ඔබලාට දැන් තේරෙනවා. ඔබගේ ඥාන තෙවෙනි ඇස් දැන් ඇරී තිබෙනවා. ජීවාත්මයකට තෙවෙනි ඇස ලැබුණු විට ඔහුට ත්‍රිකාලදර්ශී කියා කියනවා. ජීවාත්මයක් තුළ කාල තුන පිළිබඳවම වූ ඥානය තිබෙනවා. ජීවයක් කුඩා තිතකි: ඔය ඇස් දෙකින් ජීවාත්ම සත්තාවක් දැකිය හැක්කේ කෙසේද? මේ කරුණු සෑම එකක්ම අවබෝධ කර ගත යුතුයි. ඥානයේ තෙවෙනි ඇස ඇති විට ඔබලා ත්‍රිකාලදර්ශී හා ත්‍රිලෝකනාථයින් වෙනවා. අදේවවාදීන්ගෙන් ඔබලා දේවවාදීන් වෙනවා. මීට පෙර ඔබලා නිර්මාණකරු ගැනවත් නිර්මාණයේ මුල, මැද හෝ අග ගැනවත් දැනගෙන සිටියේ නැහැ. නිර්මාණයේ මුල, මැද හා අග ගැන පරමාත්ම පියාගෙන්ම දැන ගැනීමෙන් ඔබලා දැන් උරුමය ලබමින් සිටිනවා. ඥානය යනු මෙයයි. ඉතිහාසයහ හා භූගෝලයත් ගිණුම් මිණුම් සියල්ලත් තිබෙනවා. අච්චා. කවුරු හෝ දක්ෂ කෙනෙක් සිටිනවා නම්, අපි උපත් කීයක් ගන්නවාද ඒ අනුව අනිත් ආගම් වල අය උපත් කීයක් ගන්නවාදැයි කියා ගණනය කර බැලිය හැකියි. කෙසේ වෙතත්, පරමාත්ම පියා කියනවා: එවැනි කරුණු සම්බන්ධයෙන් ඔබ එතරම් ඔළුව වෙහෙසවිය යුත්තේ නැහැ. ඔබගේ කාලය අපතේ යාවි. මෙහිදී ඔබ සියල්ල අමතක කර දැමිය යුතුයි. මේ දේවල් ගැන කතා කිරීමට අවශ්‍ය නැහැ. කිසිම කෙනෙක් දන්නෙ නැති පරමාත්ම පියා, නිර්මාණකරුගේ හැඳින්වීම ඔබලා ඉදිරිපත් කරනවා. ශිව් බාබා පැමිණෙන්නේ භාරතයට පමණයි. ඔහු අනිවාර්යෙන්ම පැමිණ යමක් කරනවා. මෙන්න මේ නිසා තමයි ඔහුගේ ජන්ම දිනය සමරන්නේ. ගාන්ධි හා අනිකුත් පූජනීය අය ඇවිත් ගියා. ඔවුන් සිහි කර මුද්දර ගසා තිබෙනවා. පවුල් සැලසුම් ගැනත් මුද්දර ගහනවා. තමන් දැන් අයිති පාණ්ඩව රාජ්‍යයටයි යන කුල්මත් බව ඔබලා තුළ තිබෙනවා. මෙය සියලු බල ඇති බාබා ආණ්ඩුවයි. වෙන කිසිම කෙනෙක් මෙම වංශ සලකුණ

ගැන දන්නේ නැහැ. විනාශය සිදු වන මොහොතේදී ඔබලාගේ බුද්ධිය සෙනෙහසින් පිරී තිබෙනා බව ඔබලා දන්නවා. අපි ඉතාමත් ඉහළින් පරමාත්ම පියාව සිහි කරනවා. පියාව සිහි කරනා විට අපට සෙනෙහසේ කඳුළු ගලනවා. බාබා, ඔබ කල්ප භාගයකටම අපේ දුක් ගිනි නිවා දැම්මා. වෙන කිසිම ගුරු කෙනෙක්, ඥාති හිත මිතුරෙක් සිහි කළ යුත්තේ නැහැ. එකම එක පරමාත්ම පියාව පමණක් සිහි කරන්න. උදේ පාන්දර වෙලාව ඉතාමත් හොඳයි. බාබා, මේ නම් ඔබගේම විජ්ජාවයි. ඔබ සෑම වසර 5000 කට වරක්ම අපව අවදි කරවනවා. සෑම මිනිසෙක්ම යක්ෂ කුම්භකරණ නිද්‍රාවේ නිදි. ඔවුන් සිටින්නේ මෝහ අන්ධකාරයේයි. මෙය භාරතයේ පෞරාණික යෝගාව බව ඔබලා දැන් තේරුම් ගෙන සිටිනවා. හත යෝග වැනි ඔවුන් උගන්වන අන් සෑම දෙයක්ම ශාරීරික සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා වන ව්‍යායාම පමණයි. ඔබගේ සිහියේ මේ මුලු දැනුමම තිබෙනවා. ඉතින් ඔබලා සතුටින් සිටිනවා. මෙහි පැමිණි විට බාබා ඔබලාව පණ ගන්වන බව ඔබට තේරෙනවා. ඇතැම් අය එසේ පණ ගැන්වී නැවතත් ආපසු ගිහින් ඒ කුල්මත් බව විනාශ කර ගන්නවා: එක් එක් අය එක් එක් මට්ටම් වල, බාබා පැහැදිලි කර කියා දෙනවා: මේ අපිරිසිඳු ලෝකයයි. මිනිස්සු කන්නලව් කරනවා: අහෝ පාරිශුද්ධකරුවාණෙනි, වඩිනු මැනව. ඔවුන් තම තමන් අපිරිසිඳු අයයි කියා සලකන්නේ නැහැ. ඒ නිසා තමයි ඔවුන් පව් සෝදා ගන්න යන්නේ. නමුත් පාපය ඇත්තේ ඇඟේ නොවෙයි. පරමාත්ම පියා පැමිණ ඔබව පාරිශුද්ධ කරවා කියනවා: නිරතුරුවම මා පමණක්ම සිහි කරන්න. ඔබගේ පාප දුරු වී යාවි. ඔබට දැන් මෙම ඥානය ලැබී තිබෙනවා. භාරතය දෙව්ලොව වී තිබුණා. දැන් අපාය වෙලා. ඔය දරුවන් දැන් සිටින්නේ සංගම යුගයේයි. කෙනෙක් පාපයට වැටුණු විට ඔහු අසමත් වෙනවා. ඔහු අපායට ඇද වැටිලා වගේයි. ඔහු පස්වෙනි තට්ටුවෙන් ඇද වැටුණු නිසා සිය ගුණයකින් දඬුවම් විඳීමට සිදු වෙනවා. එමනිසා පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: භාරතය ඉතාමත් උතුම්වට තිබුණත් දැන් පරිහානියටම පත් වෙලා. ඔබලා දැන් ඉතාමත් ඥානවන්ත අය බවට පත් වෙමින් සිටිනවා. මිනිස්සු ඉතාමත් අඥානයි. බාබා මෙහිදී ඔබව කුල්මත් කරවනවා. නමුත් ඔබ ආපසු ගිය ගමන් ඒ කුල්මත් බව අඩු වී ඔබගේ සතුට අතුරුදන්ව යනවා. ශිෂ්‍යයෙක් අසීරු විභාගයකින් සමත් වුණු පසු ඒ සතුට අඩු වෙනවා ද? ඔහු හොඳින් ඉගෙනගෙන සමත් වී ශ්‍රේෂ්ඨ අයෙක් බවට පත් වෙනවා. දැන් අද ලෝකයේ තත්ත්වය දෙස මඳක් බලන්න. ඉහළම ඉහළ පියා ඔබට ඉගැන්වීමට පැමිණෙනවා. ඔහු අශාරීරිකයි. ඔය ජීවාත්මයනුත් අශාරීරිකයි. ඔබ මෙහි පැමිණ සිටින්නේ ඔබගේ චරිත කොටස රඟදැක්වීමටයි. මෙහි පැමිණ නාටකයේ රහස් කියා දෙන්නේ පරමාත්ම පියාම පමණයි. මෙම ලෝක චක්‍රය නාටකය කියාත් හඳුන්වනවා. ඒ නාටක වලදී කෙනෙක් අසනීප වුවහොත් රඟපෑම අතහැර යා හැකියි. මෙය අසීමිත නාටකයයි. ඔය දරුවන්ගේ සිහියේ මෙය නිවැරදිවම තිබෙනවා. ඔබ මෙහි පැමිණෙන්නේ තම තමන්ගේ චරිත කොටස රඟදැක්වීමටයි කියා ඔබලා දන්නවා. අපි අසීමිත නළුවන්ය. අපි ශරීර අරගෙන චරිත කොටස රඟ දක්වනවා. බාබා පැමිණ සිටිනවා. මේ සියල්ල ඔබගේ සිහියේ තිබිය යුතුයි. ඔබගේ සිහියේ අසීමිත නාටකය තිබිය යුතුයි. ලෝකයේ අසීමිත ආධිපත්‍යය ඔබ ලබනවා. එමනිසා, එයට ගැලපෙන උත්සාහයකුත් ඔබ දැරිය යුතුයි. තම පවුලේ අයත් සමඟ ඔබට නිවසේ ජීවත් විය හැකියි. නමුත් පාරිශුද්ධව සිටිය යුතුයි. තමන්ව බලා කියා ගැනීමට කවුරු හෝ කෙනෙක් ළඟ සිටිය යුතුයි කියා විවාහ වන අය රැසක් පිටරට වල සිටිනවා. ඔවුන් පසුව තම අන්තිම කැමති පත්‍රයෙන් තම සහකාරියට යම් ප්‍රමාණයකුත් පින්දහම් වලට යම් ප්‍රමාණයකුත් ලියා තබනවා. එතැන පාපයක් නැහැ. ආදරවන්තයෙකුත් ආදරවන්තියෙකුත් පාපයේ නාමයෙන් එකිනෙකාට කැප වන්නේ නැහැ. භෞතික සෙනෙහසකින් සිටිනවා. ආධ්‍යාත්මික ආදරවන්තියන් වන ඔබලා සිහි කරන්නේ එකම එක ආදරවන්තයායි. එකම එක ආදරවන්තයෙක් සිටිනා අතර ඔබ සෑම ආදරවන්තියන්ය. ඔබ සෑම කෙනෙක්ම ඒ එකම එක පියාව සිහි කරනවා. ඔහු හරිම ලස්සනයි. ඒ ජීවාත්මය ලස්සනයි: සදාකාලික ලස්සනක්. ඔබලා දැන් අවලස්සන වෙලා. ඔහු ඔබලාව ලස්සන කරවනවා. පරමාත්ම පියා දැන් ඔබලාව ලස්සන කරවමින් සිටිනා බව ඔබ දන්නවා. විවිධාකාරයේ අය මෙහි අසුන් ගෙන සිටිනවා. ඒ ඇතැම් අය කුමන සිතිවිල්ලකින් අසුන් ගෙන සිටිනවාදැයි කියාවත් කෙනෙක්ට කියන්න බැහැ. පාසලකත් ඒ වගේයි. එතැන අසුන් ගෙන සිටියත් ඔවුන්ගේ සිහිය චිත්‍රපට, යහළු හිතමිතුරන් හා අන් දේ වෙතට දිව යනවා. ආධ්‍යාත්මික සමූහ වලදීත් ඒක එහෙමමයි. මෙහිදීත් එහෙමයි. මෙය ඔවුන්ගේ සිහියට ඇතුලු නොවන අතර එය ඔවුන්ට තේරුම් ගත නොහැකි නිසා සතුටක් විඳින්නේත් නැහැ. සේවයේ කාර්ය බහුලව නිරත වීමේ ආසාව ඇති දියණියන් කිහිප දෙනෙක් සිටිනවා. නමුත් ඔවුන් කුඩා දරුවනුත් සිටිනවා. බාබා කියනවා: දරුවන් බලා ගැනීමට සේවිකාවක් යොදා ගන්න. ඔබට තවත් බොහෝ දෙනෙකුට යහපතක් සැලසිය හැකියි. ඇයි ඔබ තමන්ව ආධ්‍යාත්මික සේවාවේ නිරත නොකර ගන්නේ? ඔබගේ දරු පස් හය දෙනාව බලා කියා ගැනීමට ආයම්මා කෙනෙක් ගන්න. දැන් මේ මවුවරුන්ගේ වාරයයි. ඔබ තුළ ලොකු සතුටක් තිබිය යුතුයි. ඔබ ඉදිරියෙන්ම සිටිනවා නම් ඔබගේ සැමියා පවා සිතාවි ඇය ඉදිරියෙන්ම ගිහින්

ඉන්නවා සන්යාසි පූජකවරුන්වත් ඇය පරාජය කරාවි කියා. ඔය මච්චරුන් අනිවාර්යෙන්ම තම ලෞකික හා පාරලෞකික පවුල් කීර්තිමත් කරාවි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සියල්ල ඔබේ බුද්ධියෙන් ඉවත් කර ගන්න. ඔබගේ කාලය අපතේ හරිනා දේ වලට ඇහුම් කන් දීමට හෝ ඒ ගැන කතා කිරිමට අවශ්‍ය නැහැ.
2. ඉගෙන ගන්නා මොහොතේ දී ඔබගේ බුද්ධිය පියා හා යෝග වී තිබිය යුතුයි. බුද්ධිය එහේ මෙහේ නොයා යුතුයි. තමන්ට උගන්වන්නේ අශාරීරික පරමාත්ම පියාය යන කුල්මත් බව තබා ගන්න.

**වරදානය:** ඔබගේම ශ්‍රේෂ්ඨත්වය සහ අනෙකුත් සියලුම ජිවාත්මයන්ට වඩා ශ්‍රේෂ්ඨ, උසස් වීම පිළිබඳ ඔබේ ප්‍රශංසාව ලෝකය විසින් වන්දනාමාන කිරීමට සුදුසු බව ඔබ දැන ගනිත්වා.

**පාඨය:** ඔබගේ ස්පීතිය නිරන්තරයෙන් සියලු නිධානයන්ගෙන් පිරී ඇති විට, ඔබ තෘප්තිමත්ව සිටින අතර එවිට සිදුවීම් වෙනස් වනු ඇත.

***** ඕම ශාන්ති *****

**අශාරීරික ස්පීතියේ පුහුණුව වැඩි කරන්න(අශාරීරි සහ විදේහි).**

බාප්දාදා හදිසියේම ඔබේ ශරීර නිවසින් ඉවත් වී, ශරීර අවධානය අත්හැර, ජීවාත්ම අවධානයට පත් වී, මේ ලෝකයෙන් ඔබ්බට ඔබේ මිහිරි නිවහනට යන ලෙස ඔබට උපදෙස් දුන්නොත්, ඔබට එහි යා හැකිද? ඔබ යුධ පිටියේ සටන් කරමින් කාලය ගත කරනවා ද? අශාරීරික වන අතරතුර, ඔබේ කාලය සටන් කරමින් ගත කළහොත්, අවසාන ප්‍රශ්න පත්‍රයේ දී ඔබට ලැබෙන්නේ කුමන ආකාරයේ ලකුණු ද සහ ඔබ යන්නේ කුමන අංශයට ද?